රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 10/2012 (II)

මගේ අංක : CS/DOS/02/05/01

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය,

නිදහස් චතුරශ්‍රය,

කොළඹ 07.

2016.04.04

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

දිස්ත්‍රික් ලේකම්වරුන් / ප්‍රාදේශීය ලේකම්වරුන් සහ

ආයතන ප්‍රධානීන් වෙත.

<u>**සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම.**</u>

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2012.05.08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2012 හා 2012.06.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2012 (I) කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාව පිළිබඳව නිසි අවබෝධයක් නොතිබීම හේතුවෙන් එම සේවයට අන්තර්ග්‍රහණය වීම සඳහා මීට පෙර මනාපය පළ නොකරන ලද නිලධාරීන්ට සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ හැකි අවසාන දිනය 2016.05.31 ලෙස තීරණය කර ඇත. ඒ අනුව සංවර්ධන නිලධාරී සේවය සඳහා අන්තර්ග්‍රහණයට මනාපය පළ කරන ලද නිලධාරීන්ගේ ලිපිගොනු හා අවශ්‍ය ලේඛන අංක 10/2012 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් උපදෙස් පරිදි සකස් කර 2016.06.30 දිනට පෙර ලැබෙන සේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතුය.

03. තවද සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය සඳහා මනාපය පළ කරන ලද නිලධාරීන් හට එම ඉල්ලීම ඉල්ලා අස්කර ගැනීමට අවස්ථාව ලබාදීමට හැකියාවක් නොමැති බව කාරුණිකව දැනුම් දෙමි.

04. සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කරන ලද නිලධාරීන් එම සේවයට අන්තර්ග්‍රහණය කරන තෙක් අන්තර්කාලීන විධි විධානයක් ලෙස සංවර්ධන නිලධාරී සේවයේ තනතුරකට ස්ථාන මාරුවීමට අවස්ථාව ලබා දිය හැකි බැවින් එවැනි ඉල්ලීම් අදාල ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත 2016.12.31 දක්වා යොමු කල හැකි බව වැඩිදුරටත් දැනුම් දෙමි.

ජේ.දඩල්ලගේ
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය